පළාත් පාලන දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)
உள்ளூராட்சித்திணைக்களம்(மேல் மாகாணம்)
DEPARTMENT OF LOCAL GOVERNMENT (WESTERN PROVINCE)

අපගේ දැක්ම :- "යහපාලනයෙන් සපිරි ඵලදායී පළාත් පාලන සේවාවක්"


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My No. LGD/03/01/01 (2018) | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No. | දිනය<br>திகதி<br>Date 2020.04.06 |

චක්‍රලේඛ අංක : LGD/04/2020

ප්‍රමුඛ

බස්නාහිර පළාතේ,
සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත.

<u>පළාත් පාලන ආයතනවල සභා රැස්වීම් පැවැත්වීම.</u>

මූලික නීතිය හා උපනීති යටතේ සඳහන් විධිවිධානයන්ට යටත්ව පළාත් පාලන ආයතන විසින් සිය සාමාන්‍ය මහා සභා රැස්වීම් ලිත් මාසයක් අරමුණු කරගනිමින් පවත්වා ලිය යුතුවේ. එමෙන් ම ඉහත කී ලිඛිත නීතිය යටතේ පිරිනමා ඇති බලතල යටතේ පළාත් පාලන ආයතන විසින් අවස්ථානුකූලව විශේෂ මහා සභා රැස්වීම් පැවැත්වීම සඳහා ද නීතිමය විධිවිධාන සැලසී ඇත. එසේම අදාළ ලිඛිත නීතියෙහි සඳහන් වන්නා වූ සෙසු විධිවිධානයන් සපුරාලමින් එම සභා රැස්වීම් පැවැත්වීම එහි නීත්‍යානුකූලභාවය සඳහා වන නීතිමය අවශ්‍යතාවකි.

02. කෙසේ වුව ද, වසංගත රෝග හා නිරෝධායන ආඥා පනතට අදාළව ශ්‍රී ලංකාව පුරා නිරෝධායන විධිවිධාන ක්‍රියාත්මක වන මොහොතක ඉහත කී නීතිමය විධිවිධානයන්ට අනුකූලව පළාත් පාලන ආයතන විසින් සභා රැස්වීමක් පැවැත්විය නොහැකිය යන්න පිළිගත යුතු කරුණකි. එවැනි තත්ත්වයක් යටතේ වුව ද පළාත් පාලන ආයතනයක් වශයෙන් සභා රැස්වීම් පැවැත්වීම සඳහා අදාළ වන්නා වූ ලිඛිත නීතියේ විධිවිධානයන් හේතුකොටගෙන කවර හෝ ආකාරයකින් සභා රැස්වීමක් පැවැත්විය යුතුය යන ස්ථාවරය තුළ කටයුතු කරමින් සාමාන්‍ය මහ සභා රැස්වීම් හෝ විශේෂ මහා සභා රැස්වීම් වශයෙන් රැස්වීම් පැවැත්වීමට පළාත් පාලන ආයතන විසින් කටයුතු කරන බවට දිගින් දිගට ම කරුණු වාර්තා වේ.

03. පවත්නා වසංගත තත්ත්වය තුළ ශ්‍රී ලංකාව පුරා නිරෝධායන විධිවිධාන ක්‍රියාත්මක වීමට අවකාශ සැලසීම පවත්නා තත්ත්වය යටතේ ප්‍රමුඛ අවශ්‍යතාව වශයෙන් සැලකිය යුතු වේ. එසේ ම පළාත් පාලන ආයතනවලට අදාළ වන කර්තව්‍ය අතරින් මහජන සෞඛ්‍ය සම්බන්ධයෙන් වන කාර්යයන් නිසි ආකාරයෙන් පවත්වාගෙන යාම සෑම පළාත් පාලන ආයතනයක ම මෙම අවස්ථාවේ වගකීම හා කාර්යයක් විය යුතුය. ඊට අතිරේකව විය යුත්තේ අත්‍යාවශ්‍ය උපයෝගිතා සේවාවන්ය. එසේ ම මහා නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා වෙත නීතියෙන් පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේ දී අනුපිළිවෙලින් නගරාධිපති, නගර සභා සභාපති හා ප්‍රාදේශීය සභා සභාපති වෙත පැවරී ඇති වගකීම කෙරෙහි ද අවධානය යොමුකරනු කැමැත්තෙමි.


| ලිපිනය / முகவரி/Address | අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල / இல.204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுள்ள / No. 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| දුරකතන<br>தொலைபேசி<br>Telephone | පොදු<br>General | කොමසාරිස්<br>Commissioner | පාලන හා මානව සම්පත්<br>Admin / HR | නීති<br>Legal | සැලසුම්<br>Planning | ගිණුම්<br>Accounts | විමර්ශන<br>Investigation | ආයතන පරිපාලන<br>Establishment | ප්‍රජා සංවර්ධන<br>Community Development |
| | 2093156 | 2092570 | 2092574/2092576 | 2092572 | 2092571 | 2092573 | 2092580 | 2092582 | 2092583 |
| ෆැක්ස් / பெக்ஸ்/ Fax | 2092577 | වෙබ් ලිපිනය/ இணையம்/Web | www.lgd.wpc.gov.lk | ඊමේල් /ஈமெயில்/ Email | lgd@wpc.gov.lk | | | | |

04. ඒ සඳහා මහ නගර සභා ආඥා පනතේ 14 (3) උපවගන්තිය, නගර සභා ආඥා පනතේ 19 (3) උපවගන්තිය හා ප්‍රාදේශීය සභා පනතේ 8 (1) උපවගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමුකරනු කැමැත්තෙමි. ඒ අනුව, සභාවක් විසින් කළයුතු බවට නීතියේ සඳහන් කාර්යයක් නගරාධිපති හෝ සභාපතිවරයා විසින් ක්‍රියාත්මක කිරීම නීත්‍යානුකූල වනු ඇත. එබැවින් මෙම අවස්ථාවේ දී පළාත් පාලන ආයතන විසින් සිය කර්තව්‍යයන් අරමුණු කරගනිමින් පළාත් පාලන ආයතන විසින් කළයුතු බවට ලිඛිත නීතියෙහි සඳහන් කාර්යයන් නගරාධිපති හෝ සභාපතිවරයා විසින් ක්‍රියාත්මක කිරීමට හැකියාවක් ඇති බව පෙන්වා දෙමි.

05. එබැවින් පළාත් පාලන ආයතන විසින් සභා රැස්වීම් පැවැත්වීම නිරෝධායන නීතිය අභිබවා සිදුකිරීමේ අවශ්‍යතාවක් පැන නොනගින බවත්, ඉහතින් පෙන්වා දී ඇති විධිවිධාන සැළකිල්ලට ගනිමින් බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයන්හි ගරු නගරාධිපතිවරුන්, ගරු සභාපතිවරුන් ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාවය පවතින බවත් අවධාරණයෙන් දන්වනු කැමැත්තෙමි.

කසුන් ඇපා සෙනෙවිරත්න,
පළාත් පාලන කොමසාරිස්,
බස්නාහිර පළාත.

පිටපත් : 01. බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා. - කා.දැ.ගැ.ස.
02. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත. - කා.දැ.ගැ.ස.
03. පළාත් පාලන ලේකම්, බස්නාහිර පළාත. - කා.දැ.ගැ.ස.
04. පළාත් පාලන සහකාර කොමසාරිස් (කොළඹ/ගම්පහ/කළුතර) - අ.කා.ස.